ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2014/09/30 |

## 2014 සැප්තැම්බර් මාසයේ උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, වාර්ෂික සාමාන්‍ය පදනම මත, 2014 අගෝස්තු මාසයේ පැවති සියයට 4.5 සිට 2014 සැප්තැම්බර් මාසයේ දී සියයට 4.2 දක්වා පහත වැටිණි. 2014 සැප්තැම්බර් මාසයේ දී ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය පූර්ව මාසයේ පැවති සියයට 3.5 හි නොවෙනස්ව පැවතිණි.



2014 සැප්තැම්බර් මාසයේ දී කො.පා.මි.දර්ශකයෙහි වූ සියයට 0.2 ක මාසික පහත වැටීම සඳහා ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයේ අයිතමයන්ගේ මිල ගණන් පහළ යාම ප්‍රධාන වශයෙන් හේතු විය. ආහාර කාණ්ඩය තුළ, එළවළු වර්ග බොහොමයක, කරවල, බිත්තර, අමුමිරිස්, අර්තාපල්, රතුළූණු, ලොකුළූණු සහ සමහර මත්ස්‍ය වර්ගවල සාමාන්‍ය මිල ගණන් ඍතුමය බලපෑම් හේතුවෙන් පූර්ව මාසයට සාපේක්ෂව පහළ ගියේය. මේ අතර, බොහොමයක් සහල් සහ සමහර පළතුරු වර්ගවල මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගියේය.

ආහාර නොවන කාණ්ඩයේ, නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන; සහ ප්‍රවාහන යන උප කාණ්ඩයන්හි මිල ගණන් 2014 සැප්තැම්බර් මස 17 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සිදුකළ ඉන්ධන ගාස්තු සංශෝධනය හේතුවෙන් පහළ ගියේය. රෙදිපිළි හා පාවහන්; සෞඛ්‍ය; සන්නිවේදන; අධ්‍යාපන; සහ විනෝදාත්මක හා සංස්කෘතික; යන උපකාණ්ඩයන්ගේ මිල ගණන් මෙම මාසය තුළ දී නොවෙනස්ව පැවතිණි. මේ අතර, ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තුව; සහ විවිධ භාණ්ඩ හා සේවා; යන අනෙකුත් උපකාණ්ඩයන්ගේ මිල ගණන් මාසය තුළ ඉහළ ගියේය.

ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පෙන්නුම් කරන මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2014 අගෝස්තු මාසයේ දී පැවති සියයට 3.9 හි සිට සැප්තැම්බර් මාසයේ දී සියයට 3.7 දක්වා පහළ ගියේය. මේ අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය පූර්ව මාසයේ වාර්තා කළ සියයට 3.2 හි ම නොවෙනස්ව පැවතිණි.